# දේශපාලන විද්‍යාව

## අනුමාන ප්‍රශ්න පත්‍රය

**1 පත්‍රය** **කාලය පැය 02යි**

**සැලකිය යුතුයි :-**

**මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න 30 කින් සහ කෙටි ප්‍රශ්න 20 කින් සමන්විත වේ.**

**සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.**

**එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 100 කි.**

**එක් එක් ප්‍රශ්නවලට දී ඇති උපදෙස්වලට අනුව සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

(1) නූතන දේශපාලන විද්‍යාවේ පියා ලෙස සැලකෙන්නේ
(1) ප්ලේටෝය (2) ඇරිස්ටෝටල්ය. (3) හෙගල්ය. (4) මැකියාවෙලීය. (5) හැරල්ඩ් ලැස්කිය.

(2) දේශපාලන විද්‍යාව පිළිබඳව ඉදිරිපත්වී ඇති නිර්වචන කිපයක් පහතින් දැක්වේ. අදාළ නොවන නිර්වචනය තෝරන්න
(1) රාජ්‍ය පිළිබඳව අධ්‍යයනයකි. (2) බලය පිළිබඳව අධ්‍යයනයකි.
(3) රටක පාලන රටාවේ මූලික අංග පිළිබඳව කරන අධ්‍යයනයකි.
(4) රාජ්‍ය කටයුතු මෙහෙයවීම හා ක්‍රියාකාරිවීමේ ස්වරූපය හැදෑරීමකි.
(5) සත්‍ය කරුණු හදාරණ ස්වභාවික විද්‍යාවකි.

(3) ප්‍රිතිමත් හා ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමේ අරමුණෙන් මිනිසුන් එකට එකතුවී පිහිටුවා ගත් සංවිධානය රාජ්‍යය නම් වේ. රාජ්‍යය පිළිබඳ මෙම නිර්වචනය ඉදිරිපත් කළේ
(1) ප්ලේටෝය (2) ඇරිස්ටෝටල්ය. (3) කාල් මාක්ස් ය. (4) මැකියාවෙලීය. (5) හැරල්ඩ් ලැස්කිය.

(4) පාලකයා ජනතාවට වගකිව යුතු යැයි ප්‍රථම වරට ප්‍රකාශ කරනු ලැබුයේ.
(1) ස්ත්‍රී වාදයෙනි (2) සමාජ සම්මුතිවාදයෙනි (3) පැසිස්ට්වාදයෙනි
(4) ලිබරල්වාදයෙනි (5)සමාජවාදයෙනි

(5) මාක්ස්වාදයට අනුව පන්ති විරහිත සමාජක්‍රමයක් ඇතිවී රාජ්‍යයේ අවශ්‍යතාවය අහෝසි වන්නේ
(1) වහල් සමාජයෙනි (2) වැඩවසම් සමාජයෙනි (3) ධනවාදී සමාජයෙනි
(4) කොමිනිස්ට් සමාජයෙනි. (5)සමාජවාදී සමාජයෙනි

(6) දේශපාලන මතවාද

**A** එකිනෙකට සමාන අදහස් මාලාවකින් සමන්විත වේ.

**B** සමාජයේ සෑම කොටසකගේම දේශපාලන විඥානය හැඩගැස්වීමට දායක වේ.

**C** සමාජ කොටස් දේශපාලන ක්‍රියාකාරීත්වයට යොමු කරයි.

**D** ලෝක දේශපාලනයේදී විශාල කාර්යභාරයක් ඉටුකරයි.

**E** සමාජයේ විශාල ජන කොටසකගේ ආකර්ෂනය දිනා ගැනීමට සමත් වෙයි.

(1)**ABCD** (2) **ABCE** (3) **ABDE** (4) **ACDE** (5) **BCDE**

(7) දේශපාලන ආයතන

**A** විධිමත් භාවයකින් යුක්තවෙයි. **B** නීති රීති .රෙගුලාසි ,චර්යා පද්ධති යන මේවායින් සමන්විත වේ.

**C** දේශපාලන අධ්‍යයනයට අදාළ වන ප්‍රධාන පෙලේ ආයතන 4 කින් සමන්විත වේ.

**D** නිශ්චිත අරමුණු සඳහා ගොඩනැගී ඇත. **E** රාජ්‍යය සහ ආණ්ඩුව යන ආයතන දෙකෙන්ද සමන්විතවේ.

(1)**ABCD** (2) **ABCE** (3) **ABDE** (4) **ACDE** (5) **BCDE**

(8) පුද්ගල නිදහස බුක්තිවිඳිය හැක්කේ රජයට මුළුමනින්ම අවනතවීමෙනි. නීතිය පිළිබඳ මෙම අදහස ඉදිරිපත් කරන ලද්දේ .

(1) පැසිස්ට්වාදයෙනි (2) මාක්ස්වාදයෙනි (3) ප්‍රජාතන්ත්‍රවාදයෙනි (4) ලිබරල්වාදයෙනි (5)සමාජවාදයෙනි

(9) Six Books Concerning The State යන කෘතිය තුළින් ස්වාධිපත්‍ය සංකල්පය හඳුන්වාදෙන ලද්දේ

(1) හැරල්ඩ් ලැස්කිය (2) තෝමස් හොබ්ස්ය. (3) ජීන් බොඩැන්ය.

(4) මැකියාවෙලිය. (5) රූසෝය.

(10) බලතල බෙදීමේ න්‍යාය පිළිබඳව පිළිගත් මතය ඉදිරිපත් කරන ලද්දේ

(1) හැරල්ඩ් ලැස්කිය (2) තෝමස් හොබ්ස්ය. (3) ජීන් බොඩැන්ය.

(4) මැකියාවෙලිය. (5) මොන්ටෙස්ක්‍යූ ය

(11) සාමාන්‍ය නීතියක් වෙනස් කරන අයුරින් සරල බහුතරයකින් වෙනස් කළ හැකි ව්‍යවස්ථාව

(1) අනම්‍ය ව්‍යවස්ථාවකි. (2) නම්‍ය ව්‍යවස්ථාවකි. (3) ඒකීය ව්‍යවස්ථාවකි.

(4) ලිඛිත ව්‍යවස්ථාවකි. (5) සන්ධීය ව්‍යවස්ථාවකි.

(12) සමුහාණ්ඩුවාදයේ ලක්ෂණයක් වන්නේ,

**1.** පෞද්ගලික නිදහස පිළිබඳ අදහස ප්‍රතික්ෂේප කරයි.

**2.** පාරම්පරිකව පවත්වන රාජ්‍ය නායකත්වය අගය කරයි.

**3.** ලිබරල්වාදය සමග සෑම අතකින්ම සමානය.

**4.** දේශපාලන වශයෙන් සක්‍රිය පුරවැසියා අගය කරයි.

**5.** 18 වන සියවස තුළදී ඉස්මතු වූ මතවාදයකි. (..........)

(13) ෆැසිස්ට්වාදයේ ලක්ෂණයක් වන්නේ,

1.රාජ්‍ය පුද්ගලයා වෙනුවෙන් පවතින බව කියයි.

2.සමානාත්මතාව අගය කරයි.

3.ජාතියේ උත්තරීතරත්වය අගය කරයි.

4.සාකච්ඡාව හා සංවාදය තුළින් ගැටලු විසඳාගනී.

5.සමාජවාදය විසින් මතු කරන ආර්ථික ක්‍රමය අගය කරයි. (..........)

(14) බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ නිවැරදි ප්‍රකාශය

(1) නොලියූ ව්‍යවස්ථාවකි,/අනම්‍යය/ඒකීයවේ (2) අලිඛිතය /නම්‍යය/ඒකීයය (3) ලිඛිතය,නම්‍යය,ඒකීයය

(4) අලිඛිතය /අනම්‍යය/ඒකීයය (5) අලිඛිතය /නම්‍යය/සන්ධීයය.

(15) බ්‍රිතාන්‍ය පාලන සමය තුළ මෙරට ඇතිවූ වෙනස්කම් අතර සාවද්‍ය ප්‍රකාශය
(1) වැඩවසම් ක්‍රමය බිඳ වැටුනි.
(2) නව ආර්ථික ක්‍රමයක් බිහිවිය.
(3) ඉංග්‍රීසි උගත් මධ්‍යම පංතියක් බිහිවිය.
(4) උගත් මධ්‍යම පංතිය දේශපාලන කටයුතුවලට දැක්වූයේ දැඩි උදාසීන බවකි.
(5) ආගම් හා බද්ධවී සංස්කෘතික පුනර්ජීවන ක්‍රම පැන නැගුනි.

**(16)අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,**

i. **දේශපාලන විධායකය කොටස් දෙකකට බෙදීම තුළින් ගොඩනගා ගනී.**
ii. **ජනාධිපතිවරයා පත් කරන්නේ අගමැතිවරයා විසිනි.**
iii. **කැබිනට් මණ්ඩලයේ නායකත්වය අගමැතිවරයා දරයි.**
iv. **ආරම්භ වූයේ ඇමරිකා එක්සත් ජනපදයෙනි.**
v. **ජනාධිපතිවරයා ව්‍යවස්ථාව තුළින්ම දුර්වල කරයි.** (..........)

(17) 1931 ඩොනමෝර් විධායක කාරක සභා සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න
(1) රාජ්‍ය නිලධාරීන් තිදෙනාගේ අදිසි හස්තය සියළුම කාරක සභා කෙරෙහි බලපෑම
(2) කිසිදු භේදයකින් තොරව සියළුම මන්ත්‍රීවරු කාරක සභා අතර බෙදා හැරීම
(3) පාලන කටයුතුවලදී අනවශ්‍ය ප්‍රමාදයක් ඇතිවීම
(4) කාරක සභා අතර මනා සම්බන්ධයක් නොවීම
(5) කාරක සභා අතර ප්‍රතිපත්තිමය එකඟතාවයන් දක්නට නොලැබීම.

(18) 1947 සෝල්බරි රාජ්‍ය සේවා කොමිෂම සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය තෝරන්න
(1) 1947 පූර්ණ ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂමක් පත්කරන ලදි.
(2) මෙහි සභාපති ඇතුළු සාමාජිකයින් අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකරු විසින් පත් කරන ලදි.
(3) උභය මන්ත්‍රී මණ්ඩල සාමාජිකයින්ට මෙයට පත්විය නොහැක.
(4) මෙහි නියෝජිතයින් ඉවත් කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවේ අනුමතිය අත්‍යාවශ්‍ය වේ.
(5) රාජ්‍ය සේවා කොමිෂමට බලපෑම් කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

(19) අධිකරණයේ ස්වාධීනත්වය සඳහා සෝල්බරි ව්‍යවස්ථාවෙන් යොදා තිබූ ප්‍රතිපාදනයක් නොවන්නේ
(1) ඉහළ අධිකරණවල විනිශ්චකාරවරු අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකරු විසින් පත් කිරීම.
(2) ඉහළ අධිකරණවල විනිශ්චකාරවරු ඉවත් කිරීම පාර්ලිමේන්තුවේ අනුමතියෙන් සිදු වීම.
(3) පහළ අධිකරණවල විනිශ්චකාරවරු සම්බන්ධ කටයුතු අධිකරණ සේවා කොමිෂමෙන් සිදුකිරීම
(4) විනිශ්චකාරවරුන්ගේ වැටුප් ඒකාබද්ධ අරමුදලින් ගෙවීම
(5) නඩුතීන්දු පිළිබඳව ඕනෑම අයෙකුට විවේචන ඉදිරිපත් කිරීමට ඇති හැකියාව

(20) දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් අදාළ නොවන්නේ
(1) විසිරී ඇති මහජන මතය ඒකරාශි කිරීම
(2) ක්‍රමවත් සංවිධාන රටාවක් තිබීම
(3) ඒ ඒ කණ්ඩායම්වල ප්‍රතිවිරෝධතා හේතුවෙන් දේශපාලන පක්ෂ බිහිවී ඇත.
(4) දේශපාලන පක්ෂයක් යනු එකිනෙක අදහස් හා පංති ස්වරූපය විදහාපාන කැටපතකි.
(5) දේශපාලන පක්ෂයක මූලික පරමාර්ථය විය යුත්තේ මැතිවරණ තුළින් බලය ඇල්ලීම පමණකි.

(21) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,

A. දශක අටක ඉතිහාසයක් ඇති පක්ෂ ක්‍රමයකි.

B. නිදහසින් පසු ආරම්භ වී ඇත.

C. කුඩා පක්ෂ ගණනාවක් පවතී.

D. අධිපති ද්විපක්ෂ ක්‍රමයක් ලෙස හඳුනාගත හැකිය.

E. ජනවාර්ගික පක්ෂ පැවතීම දැකගත හැකිය.

**(1)ADE** **(2) CDE** **(3) ABC** **(4)BCD** **(5)ACDE** **(..........)**

(22) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාට පැවරී ඇති විධායක බලයක් නොවන්නේ

(1) අගමැතිගේ උපදෙස් මත කැබිනට් මණ්ඩලය පත් කිරීම (2) සන්නද්ධ සේවාවල ප්‍රධානියා වීම

(3) රාජ්‍ය සේවා විනය මණ්ඩලය පත්කිරීම (4) අධිකරණ සේවා විනය මණ්ඩලය පත් කිරීම

(5) ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වලට අවසාන අනුමතිය දීම

(23) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අසත්‍ය ප්‍රකාශය තෝරන්න

(1) නීති සම්පාදනය පිළිබඳ පරමාධිපත්‍ය බලය ජාතික රාජ්‍ය සභාවට හිමිවේ.

(2) ජාතික රාජ්‍ය සභාවේ ප්‍රධානියා කතානායක වරයායි.

(3) ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වලට අවසාන අනුමතිය ලබා දෙන්නේ කතානායකවරයායි.

(4) ආණ්ඩුවේ ත්‍රිවිධ බලයම ජාතික රාජ්‍ය සභාව වටා ගොනු වී ඇත.

(5) ජනාධිපතිගේ අභිමතය පරිදි ජාතික රාජ්‍ය සභාව විසිරුවා හැරිය හැකිය.

(24) 1978 ව්‍යවස්ථාවේ 19 වෙනි සංශෝධනයෙන් හඳුන්වාදුන් ස්වාධීන කොමිෂන් සභාවක් නොවන්නේ

(1) මැතිවරණ කොමිෂන් සභාව. (2) විදේශ සේවා කොමිෂන් සභාව. (3) පොලිස් කොමිෂන් සභාව.

(4) රාජ්‍ය සේවා කොමිෂන් සභාව. (5) විගණන සේවා කොමිෂන් සභාව.

(25) 1978 ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන් ජනමත විචාරණයට අදාළ නොවන වගන්තිය කුමක් ද

(1) පාර්ලිමේන්තුවේ ප්‍රතික්ෂේප වූ පනත් කෙටුම්පතක් ජනාධිපතිවරයාට ජනමත විචාරණයට ලක් කළ හැකිය.

(2) ජාතික වැදගත්කමක් ඇති කරුණක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට ජනමත විචාරණයක් කැඳවිය හැකිය.

(3) 1978 ව්‍යවස්ථාවේ 10 සහ 11 වගන්ති වෙනස් කිරීමට නම් ජනමත විචාරණයක් පැවැත්විය යුතුය.

(4) පාර්ලිමේන්තුවේ නිල කාලය දීර්ඝ කිරීමට මිස ජනාධිපතිවරයාගේ නිල කාලය දීර්ඝ කිරීමට ජනමත විචාරණයක් අවශ්‍ය නොවේ.

(5) ජනමත විචාරණයේ වලංගු බවට අභියෝග කරන්නේ නම් දින 21 ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කළ යුතුය.

අංක 26 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. ඒ එක් එක් ප්‍රශ්න අංකයට අදාළව දී ඇති යෙදුම් යුගලය සම්බන්ධයෙන් පහත 1 වගුව සඳහා වන යොමුවෙහි සඳහන් 1,2,3,4 සහ 5 යන වරණවලින් සුදුසු වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉරමත ලියන්න

1 වන වගුව සඳහා යොමුව

| අංකය | ප්‍රකාශය-1 | ප්‍රකාශය-2 |
|---|---|---|
| 01 | සත්‍යය | සත්‍යය |
| 02 | සත්‍යය | අසත්‍යය |
| 03 | අසත්‍යය | සත්‍යය |
| 04 | අසත්‍යය | අසත්‍යය |
| 05 | සත්‍යය | සත්‍යය වන අතර පළමු ප්‍රකාශය වඩාත් පැහැදිලි කරයි. |